සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය 2020
## Third Term Test

| 11 ශ්‍රේණිය Grade 11 | බුද්ධ ධර්මය - I | පැය එකයි One hour |
|---|---|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

---

01) තේජසින් සපිරි, එහෙත් ශාන්ත වූ, ප්‍රියංකර වූ, බෝසතුන්ගේ අනූපමේය රූප ශ්‍රීය වර්ණනා කරමින් නිබ්බුත පද කීවේ,
(i) යශෝධරා දේවිය යි. (ii) සුජාතා දේවිය යි.
(iii) කිසාගෝතමී දේවිය යි. (iv) මල්ලිකා දේවිය යි.

02) ආලවක කුමරුට, පේෂකාර දියණියට, ඡත්තමාණවකට පිහිට වීම තුළින් පෙන්වන බුදුරදුන්ගේ ගුණය කුමක් ද?
(i) ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය (ii) අසරණ සරණ ගුණය
(iii) පුරිසදම්ම සාරථී ගුණය (iv) තාදී ගුණය

03) බුදුරජාණන් වහන්සේ ආර්ය මාර්ගයෙහි ගමන් කළ නිසාත්, සුන්දර වූ නිර්වාණයට සැපත් වූ නිසාත්, දෙලොවටම වැඩ ඇති යහපත් වචන කථා කරන නිසා හඳුන්වන්නේ,
(i) ''අරහං'' නමිනි. (ii) ''සුගත'' නමිනි.
(iii) ''ලෝකවිදූ'' නමිනි. (iv) ''සත්ථා දේවමනුස්සානං'' නමිනි.

04) ''දානං සීලං ච නෙක්ඛම්මං'' යන ගාථාවෙහි සඳහන් ධර්ම කරුණු හඳුන්වන පොදු නාමය කුමක් ද?
(i) ''දසරාජ ධර්ම'' නමිනි. (ii) ''දස පුණ්‍ය ක්‍රියා'' නමිනි.
(iii) ''දස පාරමිතා'' නමිනි. (iv) ''දස සක්විති වත්'' නමිනි.

05) ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු යන එකිනෙකට බල පවත්වන වීර්යයෙහි යෙදී කටයුතු කිරීමෙන් දුරු වන නීවරණය වන්නේ,
(i) ව්‍යාපාද නීවරණය යි. (ii) විචිකිච්ඡා නීවරණය යි.
(iii) කාමච්ඡන්ද නීවරණය යි. (iv) ථීනමිද්ධ නීවරණය යි.

06) බුදුරජාණන් වහන්සේ සිතීමේ හා විමසීමේ නිදහස දක්වූයේ කිනම් සූත්‍රයේදී ද?
(i) කාලාම සූත්‍රය (ii) පරාභව සූත්‍රය
(iii) මහා මංගල සූත්‍රය (iv) මහා නිධාන සූත්‍රය

07) කාය කම්ම වලට අයත් නොවන අංගය වන්නේ,
(i) අභිධ්‍යාව යි. (ii) කාමමිථ්‍යාචාරය යි.
(iii) ප්‍රාණඝාතය යි. (iv) අදත්තාදානය යි.

08) බුදුරජාණන් වහන්සේ ලබා දුන් තනතුරු පිළිබඳව අතෘප්තිකරව ඊට චෝදනා එල්ල කළේ,
(i) දෙව්දත් හිමිය. (ii) රාහුල හිමිය. (iii) අංගුලිමාල හිමිය. (iv) චන්න හිමිය.

09) ''මම පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවේ.'' මෙසේ ප්‍රකාශ කරමින් ධර්ම දානය පිණිස පොත් රචනා කළේ,
(i) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය. (ii) වැලිවිට සිරි සරණංකර හිමියන් ය.
(iii) රේරුකානේ චන්දවිමල හිමියන් ය. (iv) වීදාගම මහා මෛත්‍රී හිමියන් ය.

10) අප මහ බෝසතාණන් වහන්සේ දාන උප පාරමිතාව පිරුවේ,
(i) සිවි ජාතකයේදී ය. (ii) සස ජාතකයේදී ය.
(iii) වෙස්සන්තර ජාතකයේදී ය. (iv) වණ්ණුපථ ජාතකයේදී ය.

11) පංච නීවරණ ධර්ම යටපත් කරන භාවනාව වන්නේ,
(i) විදර්ශනා භාවනාවයි. (ii) සමථ භාවනාවයි.
(iii) බුද්ධානුස්සති භාවනාවයි. (iv) ප්‍රඥා භාවනාවයි.

12) තමා උපමා කොට ගෙන අනුන් ගැන සිතන්නට බුදු දහමෙහි උගන්වා ඇති අතර එම ධර්ම කරුණ බුදු දහමෙහි හඳුන්වන්නේ,
(i) ''අත්තාධිපති ධර්ම පරියාය'' නමිනි. (ii) ''ධම්මාධිපති ධර්ම පරියාය'' නමිනි.
(iii) ''ලෝකාධිපති ධර්ම පරියාය'' නමිනි. (iv) ''අත්තූපනායික ධර්ම පරියාය'' නමිනි.

13) මිනිස් සිරුර වෙන් වෙන් වශයෙන් ගත් කළ කිසිඳු වෙනසක් නැති බවත්, ලිංග ජාති වශයෙන් සමානාත්මතාවයක් ඇති බවත් දක්වා ඇති සූත්‍රය වන්නේ,
(i) වාසෙට්ඨ සූත්‍රය යි. (ii) අග්ගඤ්ඤ සූත්‍රය යි.
(iii) චක්කවත්ති සීහනාද සූත්‍රය යි. (iv) නිබ්බේධික සූත්‍රය යි.

14) අනුන්ගේ සිත් දැන ගැනීමේ නුවණ බුදු දහමෙහි හඳුන්වන්නේ,
(i) පුබ්බේනිවාසානුස්සති ඥානය නමිනි. (ii) ආසවක්ඛය ඥානය නමිනි.
(iii) චුතූපපාත ඥානය නමිනි. (iv) පරචිත්ත විජානන ඥානය නමිනි.

15) බුදුරජාණන් වහන්සේ රෝග වැළඳීමට හේතු වන කරුණු අටක් පෙන්වා දුන්නේ,
(i) කොණ්ඩඤ්ඤ භික්ෂුවට ය. (ii) මහානාම භික්ෂුවට ය.
(iii) අස්සජී භික්ෂුවට ය. (iv) ගිරිමානන්ද භික්ෂුවට ය.

16) අනුලෝම පටිච්චසමුප්පාදයට අනුව ''සිතින් දැඩිව අල්ලා ගැනීම නිසා නැවත නැවත භවයට එකතු වේ.'' මෙය දක්වා ඇත්තේ,
(i) ''තණ්හා පච්චයා උපාදානං'' යන්න ය. (ii) ''උපදාන පච්චයා භවෝ'' යන්න ය.
(iii) ''භව පච්චයා ජාති'' යන්න ය. (iv) ''සළායතන පච්චයා ඵස්සෝ'' යන්න ය.

17) බුදුරජාණන් වහන්සේ බෞද්ධයකු විසින් තම උත්සාහයෙන්, දැතේ මහන්සියෙන්, දහඩිය වගුරුවා දැහැමින් උපයා ගන්නා ලද ධනය සතරාකාරයකින් පරිභෝග කළ යුතු බව දක්වා ඇත්තේ කිනම් සූත්‍රයේදී ද?
(i) පත්තකම්ම සූත්‍රය (ii) විමංසක සූත්‍රය
(iii) සිගාලෝවාද සූත්‍රය (iv) පරාභව සූත්‍රය

18) සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි ගුරුවරයා විසින් සිසුන්ට ඉටු කරන යුතුකමක් නොවන්නේ,
(i) මැනවින් හික්මවීම. (ii) ආරක්ෂාව සැලසීම.
(iii) අවශ්‍ය කටයුතු ඉටු කර දීම. (iv) තම මිත්‍රයන්ට හඳුන්වා දීම.

19) පඤ්චානන්තරීය පාප කර්ම සිදු කළ අයද, කුසල පක්ෂයෙන් පංචාභිඥා අෂ්ට සමාපත්ති ආදී ධ්‍යාන උපදවා ගත් අය ද කර්මයට අනුරූපව දෙවන භවයේ සැප හෝ දුක විපාක ලබා දෙන්නේ කිනම් කර්මයට අනුව ද?

(i) උපපජ්ජවේදනීය කර්මයට අනුරූපව ය. (ii) ගරුක කර්මයට අනුරූපව ය.

(iii) අපරාපරීයවේදනීය කර්මයට අනුරූපව ය. (iv) ආචිණ්ණ කර්මයට අනුරූපව ය.

20) කණිෂ්ක ධර්ම සංගායනාවේ සභාපතීත්වය හා මූලිකත්වය දැරුවේ පිළිවෙලින්,

(i) සබ්බකාමී හිමි හා යස හිමි ය. (ii) පාර්ශව හිමි හා වසුමිත්‍ර හිමි ය.

(iii) වසුමිත්‍ර හිමි හා පාර්ශව හිමි ය. (iv) පාර්ශව හිමි හා මහා කාශ්‍යප හිමි ය.

21) ඇතැම් ස්තූපවල ගර්භයට සම්බන්ධ සිව් දිසාවට මුහුණලා තනන ලද අලංකාර තොරණක් වැනි අංගය හඳුන්වන්නේ,

(i) ''වටදාගෙය'' නමිනි. (ii) ''වාහල්කඩ' නමිනි.

(iii) ''පටිමාඝර'' නමිනි. (iv) ''චේතියඝර'' නමිනි.

22) නව අරහාදී බුදු ගුණ වල අරහං ගුණය තේමා කරගෙන දඹදෙණි යුගයේ දී රචිත ග්‍රන්ථය හා කතුවරයා වන්නේ,

(i) අමාවතුර - ගුරුළුගෝමී පඬිවරයා

(ii) පූජාවලිය - මයුරපාද පරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමි

(iii) බුත්සරණ - විද්‍යාචක්‍රවර්තී පඬිවරයා

(iv) සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි

23) ''පාලකයා මධ්‍යස්ථව හා ගැටුම් වලින් තොරව කටයුතු කිරීම'' දසරාජ ධර්ම වල හැඳින්වෙන්නේ,

(i) ''අවිහිංසාව'' ලෙසය. (ii) 'තපස'' ලෙසය.

(iii) ''ඉවසීම'' ලෙසය. (iv) ''අවිරෝධතාවය'' ලෙසය.

24) මහාචාර්ය සෙනරත් පරණ විතාන මහතා පෙන්වා දෙන පරිදි පොළොන්නරුවේ සත් මහල් ප්‍රාසාදය කිනම් හැඩයෙන් යුක්ත ද?

(i) චතුරස්‍රාකාර හැඩයෙනි. (ii) බුබ්බුලාකාර හැඩයෙනි.

(iii) ධාන්‍යාකාර හැඩයෙනි. (iv) ඝණ්ඨාකාර හැඩයෙනි.

25) සප්ත අපරිහානී ධර්ම ක්‍රියාත්මක වූයේ,

(i) කෝසල රාජ්‍යයේ ය. (ii) අංග රාජ්‍යයේ ය.

(iii) වජ්ජී රාජ්‍යයේ ය. (iv) ලිච්ඡවී රාජ්‍යයේ ය.

26) බෞද්ධ දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබා දීමට ඉරිදා පාසල් ආරම්භ කළේ,

(i) අනගාරික ධර්මපාල තුමා ය. (ii) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.

(iii) දුටුගැමුණු රජ තුමා ය. (iv) වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා ය.

27) බුදුරජාණන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ සේක. ඉන් පාරිලෙය්‍යය වනයෙහි වැඩ සිටිමින් ඇතෙකුගේ හා වඳුරෙකුගේ උවටැන් ලැබුවේ කිනම් වස් කාලයේදී ද?

(i) දොළොස්වන වස් කාලයේදී ය. (ii) දසවන වස් කාලයේදී ය.

(iii) පස්වන වස් කාලයේදී ය. (iv) හයවන වස් කාලයේදී ය.

28) ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමෙන් තමාට මුහුණ දීමට සිදු වන අකුසල කර්ම විපාක මඟහරවා ගත හැකි වීම හඳුන්වන්නේ,

(i) ගති සම්පත්තිය නමිනි. (ii) ප්‍රයෝග සම්පත්තිය නමිනි.

(iii) උපධි සම්පත්තිය නමිනි. (iv) කාල සම්පත්තිය නමිනි.

29) අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම බුදු දහමෙහි හඳුන්වන්නේ,
(i) අර්ථ චර්යාව ලෙසය. (ii) සමානාත්මතාවය ලෙසය.
(iii) ප්‍රිය වචනය ලෙසය. (iv) දානය ලෙසය.

30) ''මිය ගිය ඥාතීන්ට පිං දීම'' පංච බලි නම් වූ යුතුකම් වල හඳුන්වන්නේ,
(i) ඥාති බලි නමිනි. (ii) දේවතා බලි නමිනි.
(iii) පුබ්බපේත බලි නමිනි. (iv) අතිථි බලි නමිනි.

31) පළමු ධර්ම සංගායනාවේදී ධර්මය හා විනය කොටස් කොටස්කර භාණක පරම්පරා වලට භාර දෙන ලදී. ඒ අනුව විනය පිටකය භාර දුන් ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවේ ප්‍රධානත්වය හිමි වූයේ,
(i) මහා කාශ්‍යප තෙරුන්ට ය. (ii) ආනන්ද තෙරුන්ට ය.
(iii) අනුරුද්ධ තෙරුන්ට ය. (iv) උපාලි තෙරුන්ට ය.

32) බුදු දහම ස්ථාපිත වීමත් සමඟ ලංකාවේ ඉදි කළ මුල්ම ස්තූපය වන්නේ,
(i) ථූපාරාමය යි. (ii) මහියංගනය යි. (iii) අභයගිරිය යි. (iv) රුවන්වැලි සෑය යි.

33) ඔබ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක්දැයි පිළිවෙළින් බුදුරජාණන් වහන්සේගෙන් විමසූයේ කවුද?
(i) සොත්ථිය බමුණා ය. (ii) ද්‍රෝණ බමුණා ය.
(iii) සෝණදණ්ඩ බමුණා ය. (iv) සංජය බමුණා ය.

34) බෙල්ලන්විල රජ මහා විහාරය හා බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් අඳිනු ලැබුවේ,
(i) ඇල්බට් ධර්මසිරි මහතා හා සෝලියස් මෙන්ඩිස් මහතා ය.
(ii) සෝමබන්ධු විද්‍යාපති මහතා හා ඇල්බට් ධර්මසිරි මහතා ය.
(iii) සෝමබන්ධු විද්‍යාපති මහතා හා ජෝර්ජ් කීට් මහතා ය.
(iv) සෝලියස් මෙන්ඩිස් මහතා හා ජෝර්ජ් කීට් මහතා ය.

35) බුදු පිළිම වල දැකිය හැකි මුද්‍රා අතර දකුණු අත උඩට තම ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කරන මුද්‍රාව වන්නේ,
(i) විතර්ක මුද්‍රාව යි. (ii) අභය මුද්‍රාව යි.
(iii) ධ්‍යාන මුද්‍රාව යි. (iv) භූමි ස්පර්ශ මුද්‍රාව යි.

36) ඉරියව් අනුව බුදු පිළිම වර්ග කිරීමේ දී ඉතා දුලබ වශයෙන් දක්නට ලැබෙන චංකමන ඉරියව්වෙන් නෙළා ඇති පිළිම දක්නට ලැබෙන්නේ,
(i) පොළොන්නරුවේ ගල් විහාරයෙනි. (ii) කැලණි විහාරයෙනි.
(iii) තන්තිරිමලේ විහාරයෙනි. (iv) තිවංක ප්‍රතිමා ගෘහයෙනි.

37) භික්ෂූන් වහන්සේලාගේ කායික නීරෝගීතාවය සඳහා ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි බුදුරජාණන් වහන්සේ අනුමත කළේ,
(i) ''සක්මන් මළුව'' ය. (ii) ''විහාර මළුව'' ය.
(iii) ''බෝ මළුව'' ය. (iv) ''සැතපෙන මළුව'' ය.

38) කර්මයේ ඵල විපාක අනුව අන් සැපතට ඊර්ෂ්‍යා නොකරන්නා,
(i) අල්ප භෝග ඇති ව උපදී (ii) මහේශාක්‍ය ව උපදී
(iii) අවලස්සන ව උපදී (iv) අල්පේශාක්‍යව උපදී

39) බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය හෙවත් බාහිර පෞරුෂත්වය කෙරෙහි පැහැදී පැවිදි වූ භික්ෂුව වන්නේ,
(i) වක්කලී හිමි ය. (ii) බ්‍රහ්මායු හිමි ය.
(iii) ආනන්ද හිමි ය. (iv) උග්ගසේන හිමි ය.

40) බුදු සසුනේ මුල්වරට පෞද්ගලිකවම ආරාම පූජාවක් කළේ කවුද? එම ආරාමය කුමක් ද?
(i) මහසෙන් රජු - ජේතවනය (ii) දුටුගැමුණු රජු - රුවන්වැලි සෑය
(iii) දේවානම්පියතිස්ස රජු - ථූපාරාමය (iv) වළගම්බා රජු - අභයගිරි විහාරය



(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# තෙවන වාර පරීක්ෂණය 2020
# Third Term Test

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>Grade 11 | බුද්ධ ධර්මය - II | පැය දෙකයි<br>Two hours |

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු වැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

---

(01) (i) තාදී ගුණය ප්‍රකට වන අවස්ථා දෙකක් බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ගෙන හැර දක්වන්න.

(ii) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(iii) ''සන්දිට්ඨික'' ගුණය හඳුන්වන්න.

(iv) ''විරමණය හා සමාදානය'' යන්න හඳුන්වන්න.

(v) ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රඥාවට අයත් අංග නම් කරන්න.

(vi) බුදු දහමේ උගන්වන ''අනණ සුඛ'' හඳුන්වන්න.

(vii) පොළොන්නරු යුගයේ රචිත ගී කාව්‍ය දෙක නම් කර ඊට පාදක වූ ජාතක දෙක ලියන්න.

(viii) කල්‍යාණ මිත්‍රයෙකු සතුව පවතින ගුණ හතරක් ලියන්න.

(ix) අප මහ බෝසතාණන් වහන්සේ මෛත්‍රී පාරමිතාව පිරූ ජාතක කතා දෙකක් නම් කරන්න.

(x) ''දූරංගමං ඒකචරං'' යන ගාථාව සම්පූර්ණ කර අර්ථය ලියන්න.

(02) (i) බුදු දහමෙහි ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

(ii) භාවනා වඩන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග තුන නම් කරන්න.

(iii) ''අසහනකාරී සමාජය සුවපත් කරලීමට භාවනා ඉවහල් වේ.'' මෙම කියමන පහදන්න.

(03) (i) සිගාලෝවාද සූත්‍රයේ දී නැගෙනහිර සහ දකුණු දිසාවන්ට උපමා කරනු ලැබුවේ කවුරුන් ද?

(ii) දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.

(iii) ''සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය සමාජයක යහපැවැත්මේ පදනමයි.'' මෙම ප්‍රකාශය පහදන්න.

(04) (i) ''නතං කම්මං කතං සාධූ'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ අර්ථය ලියන්න.

(iii) ''ධම්ම පදය දැහැමි සමාජයක් ගොඩනගා ගැනීමට ඉවහල් වේ.'' විස්තර කරන්න.

(05) (i) ''ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අසති ඉදං න හෝති'' මෙම පාඨයේ අර්ථය ලියන්න.

(ii) ''අවිජ්ජා පච්චයා සංඛාරා'' කෙටියෙන් හඳුන්වන්න.

(iii) ''පටිච්චසමුප්පාද න්‍යාය සමාජ ගැටලු ඇතිවන හා නැතිවන ආකාරය පැහැදිලි කර ගැනීමට ඉවහල් වේ.'' මෙම ප්‍රකාශය පහදන්න.

(06) (i) තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් ප්‍රධාන හේතුව ලියන්න.

(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය, රාජානුග්‍රහය ලබාදුන් පාලකයා හා සහභාගී වූ භික්ෂූන් ගණන ලියන්න.

(iii) ධර්ම සංගායනා බුදු සසුනේ චිර පැවැත්මට ඉවහල් වූ ආකාරය විස්තර කරන්න.

(07) කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර හිමි

(ii) සතර අගතියෙන් තොර වීම

(iii) මහින්දාගමනය

(iv) ස්තූප